# මුදල් මණ්ඩලය
# ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 සැප්තැම්බර් 01** **චක්‍රලේඛය** **2021 අංක 08**

(මෙය 2021 සැප්තැම්බර් 01 දින නිකුත් කරන ලද 2021 අංක 08 දරන චක්‍රලේඛයේ සිංහල පරිවර්තනයකි.)

## කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහන සැලසීම

ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වය යළි ඉහළ යාමත් සමඟ, 2021 මැයි 25 දිනැති 2021 අංක 05 දරන චක්‍රලේඛය යටතේ බලපෑමට පත් ණයගැනුම්කරුවන් වෙත ලබා දී තිබූ ණය සහන දීර්ඝ කිරීමට සලකා බලන ලෙස බොහෝ පාර්ශව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉල්ලීම් කර ඇත. ඒ අනුව, දැනට පවතින කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ව්‍යාපාර සහ පුද්ගලයින් විසින් මුහුණ පා ඇති අභියෝගයන් සැලකිල්ලට ගනිමින්, 2021 මැයි 25 දිනැති 2021 අංක 05 දරන චක්‍රලේඛය යටතේ ලබා දී ඇති ණය සහන පහත සඳහන් පරිදි දීර්ඝ කරන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (බලපත්‍රලාභී බැංකු) වෙතින් ඉල්ලා සිටී. තවද, කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත් ව්‍යාපාර හා පුද්ගලයන් ගේ ඉල්ලීම පරිදි, මෙම චක්‍රලේඛය යටතේ ලබා දී ඇති සමස්ථ ප්‍රතිලාභයන්ට වඩා අඩු නොවන අයුරින් අමතර සහන සැලසීම සඳහා බලපත්‍රලාභී බැංකුහට හැකියාව ඇත.

වර්තමානයේ ව්‍යාපාර/ආදායම් උත්පාදන කටයුතුවලට මතුවී ඇති බාධා හේතුවෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන්ට, තම බැංකු ණය නිසි ලෙස පියවාගත නොහැකි වීමෙන් ඇතිවන අපහසුතා ලිහිල් කිරීම සඳහා සියළු බලපත්‍රලාභී බැංකු හරහා මෙම යෝජනා ක්‍රමය ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. සංචාරක කර්මාන්තය සඳහා ලබා දුන් ණය සහන ලබා ගැනීමට සුදුසුකම් ලත් සංචාරක අංශයේ ණය ගනුදෙනුකරුවන් සඳහා මෙම චක්‍රලේඛය අදාළ නොවනු ඇත.

### 1. 2021 සැප්තැම්බර් 01 දින වන විට සක්‍රීයව පැවති ණය පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම.

(අ) කොවිඩ්-19 ව්‍යසනයේ ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන්ගේ දැනට පවතින ණය පහසුකම් සඳහා, මුල් ණය මුදල හෝ පොලිය හෝ ඒ දෙකම හෝ 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුල අයකර ගැනීම කල් දැමීමට ඒ ඒ අවස්ථානුකූලව බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය. මෙහිදී, එවැනි ණය ගනුදෙනුකරුවන් මුහුණ දී ඇති මූල්‍ය දුෂ්කරතා, එනම් රැකියාව අහිමි වීම, වැටුප්/ආදායම හෝ වෙළඳාම් අඩු වීම හෝ අහිමිවීම, ව්‍යාපාර කටයුතු අඩාල වීම, බිඳවැටීම හෝ ව්‍යාපාර වසා දැමීම යනාදිය සැලකිල්ලට ගත යුතු වේ.

(ආ) ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි නියුතු ණය ගනුදෙනුකරුවන් විසින් සහන ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් සඳහා අවස්ථාව ලබා දීමට ප්‍රමුඛත්වය දැක්වීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

(ඇ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් විසින් මුහුණ පා ඇති මූල්‍ය දුෂ්කරතා සහ ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සැලකිල්ලට ගනිමින්, එම ගනුදෙනුකරුවන්ගේ රුපියල්වලින් හෝ විදේශ මුදලින් ඇති ණය පහසුකම් එකක් හෝ ඊට වැඩි ගණනක මුල් ණය මුදල හෝ පොලිය හෝ ඒ දෙකම ගෙවීම කල් දැමීම සිදු කළ යුතුය.

(ඈ) බලපත්‍රලාභී බැංකු විසින් කලින් පැවති ණය සහන/වාරික කල් දැමීමේ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල් (එනම් මුල් ණය මුදල,පොලිය සහ එම ණය සහන කාලයට/කල්දැමීමට අදාළ පොලී මුදල) සහ මෙම යෝජනා ක්‍රමය තුළ ගෙවිය යුතු ප්‍රමාණය (එනම් මුල් ණය මුදල සහ පොලිය) ඒකාබද්ධ කර නව ණය පහසුකමකට හැරවිය යුතුය. මෙම නව ණය පහසුකම සඳහා, පහත 1(ඉ) හි සඳහන් පරිදි 2021 සැප්තැම්බර් 01 දින සිට ඇරඹෙන පරිදි පොලී අය කළ හැකි අතර, එය පහත 1(ඊ) සහ (උ) සඳහන් පරිදි ගිවිසගත් කාල සීමාව සඳහා වෙනම ණය පියවීමේ ක්‍රමක්ෂය සටහනක් (loan amortization schedule) අනුව අය කළ යුතුය.

(ඉ) ඉහත ආපසු ගෙවීම කල්දමන ලද ඕනෑම රුපියල් ණය පහසුකමක් සම්බන්ධයෙන්, 2021 අගෝස්තු 31 දින පැවති දින-364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතයට සියයට 1 එකතු කළ අගය නොඉක්මවන වාර්ෂික පොලී අනුපාතයක් (එනම්, 5.93%+1% = 6.93%) අය කළ හැකිය. විදේශ මුදලින් ගත් ණය සඳහා බලපත්‍රලාභී බැංකු විසින් පවත්නා අඩු පොලී අනුපාත සැලකිල්ලට ගනිමින් සහනදායී පොලී අනුපාතයක් අය කළ හැකිය. තවද, කල් දැමීමේ කාලය අවසන් වූ පසු දැනට පවතින පහසුකමෙහි කල්දැමූ මුල් මුදල (differed capital amount) හැර ඉතිරි මුල් මුදල් ශේෂය (capital outstanding) සඳහා වූ පොලිය, ගිවිසුම්ගත පොලී අනුපාත යටතේ අඛණ්ඩව ගණනය වේ.

(ඊ) කල්බදු පහසුකම් ඇතුළුව වාරික ණය සම්බන්ධයෙන්, ඉහත සඳහන් 1 (ඈ) හි සඳහන් නව ණය පියවීම සඳහා බලපත්‍රලාභී බැංකු සහ අදාළ ණය ගනුදෙනුකරුවන්, ඉහත 1(අ) හි දක්වා ඇති පරිදි, ණය ගනුදෙනුකරුවන් මුහුණ දෙන මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, 2022 ජූලි 01 දින සිට මාස 6 දක්වා ආපසු ගෙවීමේ කාලසීමාවකට එකඟ විය යුතුය. මෙම ණය මුදල, ණය ගනුදෙනුකරුවන්ට අවශ්‍ය නම් ඊට පෙර වුවද ආපසු ගෙවීම

ආරම්භ කළ හැකිය. කෙසේ වෙතත්, ණය ගනුදෙනුකරුවන් ගේ දැනට පවතින පහසුකම් ආපසු ගෙවීම 2022 ජනවාරි 01 දින සිට ඇරඹිය යුතු වේ.

(උ) ඉහත සඳහන් 1 (ඈ) හි සඳහන් නව ණය පියවීම සඳහා ගනුදෙනුකරුවෙකු විසින් මාස 6 කට වඩා වැඩි කාලයක් ඉල්ලා සිටින අවස්ථාවක, ණය ගනුදෙනුකරුවෙකු සහ බැංකුව විසින් මාස 6ට පසු කාල සීමාව සඳහා සුදුසු සහන පොලී අනුපාතයකට එකඟ විය යුතුය.

(ඌ) ගනුදෙනුකරුවන් විසින් කල් දැමූ ණය මුදල් ආපසු ගෙවීම ඉක්මනින් ආරම්භ කිරීම දිරි ගැන්වීම සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් එසේ ණය මුදල් ආපසු ගෙවීම කලින් ආරම්භ කිරීමේ ප්‍රතිලාභ සහ ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීමේ ප්‍රතිඵල පිළිබඳව ණය ගනුදෙනුකරුවන් දැනුවත් කළ යුතුය.

(එ) විකල්පයක් ලෙස, ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නගාසිටුවීමේ සැලැස්මක් (Revival plan) ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, දැනට පවතින ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත (restructure) කිරීමට බලපත්‍රලාභී බැංකුවලට හැකියාව පවතී. මෙහිදී, දැනට පවතින අඩු පොලී අනුපාතිකයන් සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකුව සහ ණය ගනුදෙනුකරුවන් විසින් සුදුසු පොලී අනුපාතයකට එකඟ විය යුතු වේ.

(ඒ) 2021 සැප්තැම්බර් 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුල පියවීමට ඇති, කාරක ප්‍රාග්ධන, උකස් අත්තිකාරම්, තාවකාලික අයිරා, කෙටිකාලීන වෙළඳ මූල්‍ය පහසුකම් ඇතුළු අනෙකුත් චක්‍රීය ණය පහසුකම් පියවීම සඳහා 2021 දෙසැම්බර් 31 දක්වා කල් ලබා දීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් කල් තබන ලද කාලසීමාව සඳහා පොලී අයකිරීම ඉහත 1(ඉ) හි සඳහන් පරිදි කල් දමන ලද මුදල මත පමණක් සිදුකළ යුතුය.

(ඔ) ණය සහන කාලය තුළ, එනම් 2021 සැප්තැම්බර් 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා, දඩ පොලිය එකතු කිරීමක් හෝ අය කිරීමක් සිදු නොකළ යුතුය.

(ඕ) දැනට පවතින සංචරණ සීමාවන් හේතුවෙන් බලපෑමට පත් ගනුදෙනුකරුවන් විසින්, ණය ආපසු ගෙවීම් නියමිත දිනය දින කිහිපයකින් (උපරිම වැඩ කරන දින 15 ක් දක්වා) කල් දැමීමට කෙරෙන ඕනෑම ඉල්ලීමක් සඳහා ණය පහසුකම් කල්දැමීමක් හෝ ප්‍රතිව්‍යුහගත කිරීමක් ලෙස සැලකීමෙන් තොරව අවස්ථාව ලබා දිය යුතු අතර, ගනුදෙනුකරුවන්ගේ

එවැනි ප්‍රමාදයන් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් කිසිදු අමතර පොලියක් හෝ වෙනත් ගාස්තුවක් අය නොකළ යුතුය.

**2. 2021 සැප්තැම්බර් 01 දිනට අක්‍රිය කාණ්ඩයේ පැවති ණය පහසුකම් සඳහා හිමිවන සහන**

(අ) ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නගාසිටුවීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, 2021 සැප්තැම්බර් 01 වන විට අක්‍රිය තත්ත්වයේ පවතින ණය පහසුකම්, ඒ ඒ අවස්ථානුකූලව දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිලේඛනගත (reschedule) කිරීමට බලපත්‍රලාභී බැංකු වෙත හැකියාව පවතින අතර, මෙහිදී දැනට පවතින අඩු පොලී අනුපාතික සැලකිල්ලට ගනිමින් සුදුසු පොලී අනුපාතයක් ඇතුළු නියමයන් හා කොන්දේසි සම්බන්ධව බලපත්‍රලාභී බැංකුව සහ ණය ගනුදෙනුකරු විසින් එකඟතාවයකට පැමිණිය යුතුවේ.

(ආ) මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලේඛනගත කිරීම සඳහා සලකනු ලබන පහසුකම් සඳහා 2020 අප්‍රේල් 1 සිට 2021 සැප්තැම්බර් 01 දක්වා කාලය තුල එකතු කර ඇති හෝ අය කර ඇති දඩ පොලී කපා හැරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය.

(ඇ) බලපත්‍රලාභී බැංකු විසින් 2020 අප්‍රේල් 01 දින හෝ ඊට පසුව අක්‍රීය ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකම් වලට එරෙහිව ක්‍රියාත්මක කර ඇති සියළුම ආකාරයේ ණය නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග 2021 දෙසැම්බර් 31 වන දින දක්වා අත්හිටුවිය යුතුය. තවද, ඉහත සඳහන් ණය ගනුදෙනුකරුවන් සම්බන්ධව සාමාන්‍ය ණය ආපසු අයකිරීමේ ක්‍රියාවලියේ කොටසක් වශයෙන්, ණය ගනුදෙනුකරු අපහසුතාවයට ලක්වන ලෙස අධික ලෙස ඇමතුම් ලබා දීම/බල කිරීම හෝ හමුවීමට යාම වැලැක්වීම සඳහා බලපත්‍රලාභී බැංකු සියළු පියවර ගත යුතුය. ණය අයකර ගැනීම සම්බන්ධව අධිකරණයේ නඩු කටයුතු පවතින අවස්ථාවලදී, මෙම සහනය ලබා ගැනීම සඳහා ගනුදෙනුකරු විසින් අධිකරණය හමුවේ එකඟතාවයකට පැමිණිය යුතුය.

3. බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන ලබා දීමේදී අධික ගාස්තු හෝ අයකිරීම් සිදු නොකළ යුතු අතර, එවැනි ගාස්තු හෝ අය කිරීම් සම්බන්ධයෙන් ණය ගනුදෙනුකරුවන් ලිඛිතව දැනුවත් කළ යුතුය.

4. රුපියල් 500,000 ට අඩු චෙක්පත් වලංගු කාලය 2021 ඔක්තෝම්බර් 31 දක්වා දීර්ඝ කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය.

5. බලපත්‍රලාභී බැංකු විසින් 2021 සැප්තැම්බර් 30 දක්වා සියළු චෙක්පත් ගනුදෙනු සම්බන්ධයෙන් අගරු වූ චෙක්පත් සහ චෙක්පත් ගෙවීම් නතර කිරීම් සඳහා ගාස්තු අයකිරීමෙන් වැලකිය යුතුය.

6. පැහැදිලිවම පීඩාවට පත් ගනුදෙනුකරුවන් සඳහා, 2021 ඔක්තෝම්බර් 31 දක්වා කාල සීමාව තෙක්, සියලුම ණය කාඩ්පත් සහ වෙනත් ණය පහසුකම් සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීමෙන් වැලකීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

7. මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ලබා ගැනීමට සුදුසුකම් ඇති ණය ගනුදෙනුකරුවෙකු, එම සහන ලබා ගැනීම වෙනුවට, දැනට පවතින ණය පහසුකම් හෝ අත්හිටුවන කාල සීමාව තුළ ගෙවිය යුතු මුදල් කලින් පියවීමට කැමැත්ත ප්‍රකාශ කර තිබේ නම්, එවැනි ගනුදෙනුකරුවන්ට පොලී ප්‍රතිදානයන් (interest rebate) ලබා දෙන ලෙසට බලපත්‍රලාභී බැංකු දිරිගන්වනු ලැබේ. තවද, එවැනි පහසුකම් සඳහා කිසිදු පූර්ව පියවීමේ ගාස්තු හෝ කල්බදු පහසුකම් වල අනාගත පොලිය අයකිරීමෙන් වැලකීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

**8. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම්**

(අ) බලපත්‍රලාභී බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය අයදුම්පත්, හුදෙක් අසතුටුදායක ණය තොරතුරු කාර්යාංශ (CRIB) වාර්තාවක් මත පමණක් පදනම්ව ප්‍රතික්ෂේප කිරීමෙන් වැලකිය යුතුය.

(ආ) මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීම ණය ගැනුම්කරුවන්ගේ ඉදිරි ණය තොරතුරු වාර්තා සහ අනාගත ණය ශ්‍රේණිගත කිරීම් කෙරෙහි බලපෑමක් ඇති නොවන ආකාරයෙන්, මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය ආපසු ගෙවීම කල්දැමීම්/ප්‍රතිව්‍යුහගත කිරීම් වාර්තා කිරීම සඳහා ක්‍රමවේදයක් බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සමඟ සාකච්ඡාකොට සකස්කළ යුතු වේ.

**9. ප්‍රතිමූල්‍යන/පොලී සහනාධාර යෝජනා ක්‍රම යටතේ ණය පහසුකම් සඳහා සහන**

විවිධ ප්‍රතිමූල්‍යකරණ හෝ පොලී සහනාධාර යෝජනා ක්‍රම යටතේ ලබා දෙන ණය පහසුකම් සඳහා සහන සැලසීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු අදාළ ආයතනවලින් අවශ්‍ය මඟ පෙන්වීම් ලබා ගත යුතුය.

**10. ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා අවසාන දිනය**

(අ) බලපත්‍රලාභී බැංකු විසින් මෙම චක්‍රලේඛය සියලුම ශාඛා වෙත දින 3ක් ඇතුළත සංසරණය කළ යුතු අතර දින 7ක් ඇතුළත අවශ්‍ය අභ්‍යන්තර මාර්ගෝපදේශ/ චක්‍රලේඛ ලබා දිය යුතුය.

(ආ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ට ඉහත සඳහන් ණය සහන සඳහා 2021 සැප්තැම්බර් 21 දින හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍ය මඟින් ඉල්ලුම් කළ හැකිය. බලපත්‍රලාභී බැංකු විසින් මෙම ණය සහනයන් ,අයදුම් කළ හැකි අවසාන දිනය සහ අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකෘතිය ආදී තොරතුරු සුදුසුකම් ලත් සියලුම ණය ගනුදෙනුකරුවන් වෙත විද්‍යුත් තැපෑල සහ කෙටි පණිවුඩ ඇතුළු මුද්‍රිත හා/හෝ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ කඩිනමින් සන්නිවේදනය කළ යුතුය.

(ඇ) පිළිගත හැකි හේතු සහිතව 2021 සැප්තැම්බර් 21න් පසුව වුවද කරනු ලබන ඕනෑම ඉල්ලීමක් සලකා බැලීමට බලපත්‍රලාභී බැංකු වෙත හැකියාව ඇත.

(ඈ) සුදුසුකම් ලද මුත් ණය ආපසු ගෙවීමේ හැකියාව ඇති ණය ගනුදෙනුකරුවන් විසින් ණය පහසුකම් කල්දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අයදුම් කිරීම වෙනුවට ණය ආපසු ගෙවීම් සඳහා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඉ) මෙම ණය සහන සඳහා අයදුම් කරනු ලබන ණය ගනුදෙනුකරුවන් ගේ ඉල්ලීම් අනුමත කිරීමට පෙර අදාල ණය පහසුකම් කල්දැමීමේ හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ආකාරය පිළිබඳව දැනුවත් කිරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතු අතර ඒ සඳහා ගනුදෙනුකරුගේ කැමැත්ත ලිඛිතව හෝ විද්‍යුත් ආකාරයෙන් ලබා ගත යුතුය.

(ඊ) අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමකදී, බලපත්‍රලාභී බැංකු විසින් වඩාත් සුදුසු ලෙස දින 14 ක් තුලදී ලිඛිත ව හෝ විද්‍යුත් මාධ්‍ය මඟින් එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු අයදුම්කරුට දැනුම් දිය යුතු අතර අයදුම්කරුට තම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනයක් අධ්‍යක්ෂක, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව (FCRD), ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාවක් තිබෙන බව දැනුම් දිය යුතුය. තවද, ණය ගනුදෙනුකරුට අවශ්‍ය නම් එම තීරණය සමාලෝචනය කිරීමේ අවස්ථාව ලබා ගැනීමට අයිතියක් පවතින බව බලපත්‍රලාභී බැංකුව විසින්, එම ලිපියේ ම දැක්විය යුතුය.

**11. ණය සහන කාල සීමාව සම්බන්ධව ගිණුම් කටයුතු**

බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන කාලසීමාවට අදාලව ගිණුම්තැබීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 ඔක්තෝබර් 28 දින නිකුත් කරන ලද 2020 අංක 09 දරන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. බලපත්‍රලාභී බැංකු විසින් වැඩි අවධානමක් සහිත ණයගැනියන් හෝ අංශ සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් සිදුකලයුතු අතර මේ සම්බන්ධව අමතර මගපෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් උපදෙස් පැතිය හැක.

**12. වාර්තාකරණ අවශ්‍යතා**

බලපත්‍රලාභී බැංකු විසින් 2021 සැප්තැම්බර් 30 වන දින සිට වැඩකරන දින 15 ක් ඇතුළත, සෑම මසකම 30 වනදින වන විට තම ණය ගනුදෙනුකරුවන් විසින් ලබා ගත් සහන පිළිබඳ තොරතුරු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කළ යුතු අතර, අදාළ වාර්තාකරණ ආකෘති බලපත්‍රලාභී බැංකු වෙත ඉදිරිකාලයේදී යොමු කරනු ඇත.

*අත්සන් කලේ*

**මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්**
*මුදල් මණ්ඩලයේ සභාපති සහ*
*ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති*